# ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ කළමනාකරණ සහකාර තාක්ෂණ බණ්ඩ - 3 සේවා ගණයේ මූලික තාක්ෂණ ශිල්පි III තනතුර වලට බඳවා ගැනීමේ විවෘත තරඟ විභාගය-2025

# Open Competitive Examination for Recruitment to Grade 111 of Railway Basic Technician-2025

01.ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ කළමනාකරණ සහකාර තාක්ෂණ බණ්ඩ - 3 සේවා ගණයේ පහත තනතුරු වල පවතින පුරප්පාඩු සඳහා පුහුණු කාලසීමාවකට බඳවා ගැනීමේ විවෘත තරඟ විභාගය සඳහා සුදුසුකම් ලත් ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| අනු අංකය | තනතුර | පුරප්පාඩු ගණන |
|---|---|---|
| 1 | මූ.තා.ශි.(කම්බිකරු) | 27 |
| 2 | මූ.තා.ශි.(වඩු) | 147 |
| 3 | මූ.තා.ශි. (පෙදරේරු) | 84 |
| 4 | මූ.තා.ශි. (සංකේත ලේඛක) | 2 |
| 5 | මූ.තා.ශි (පිංතාරු) | 36 |
| 6 | මූ.තා.ශි.(බෙලෙක් වැඩ) | 7 |
| 7 | මූ.තා.ශි. (පොරෑදු) | 5 |
| 8 | මූ.තා.ශි.(වාත්තු) | 16 |
| 9 | මූ.තා.ශි.(ප්‍රගති) | 21 |
| 10 | මූ.තා.ශි.(කම්මල්) | 39 |

**02.** නිවේදනයේ දක්වා ඇති පුහුණු කාල සීමාව සඳහා බඳවා ගැනීමේ සුදුසුකම් සම්පූර්ණ කරන ලද අයදුම්කරුවන් සඳහා දුම්රිය සාමාන්‍යාධිකාරී විසින් පවත්වනු ලබන ලිඛිත පරීක්ෂණයෙන් හා යෝග්‍යතා ඇගැයීමේ සම්මුඛ පරීක්ෂණයෙන් ලබා ගන්නා මුළු ලකුණු වල කුසලතා අනුපිළිවෙළ අනුව පවතින පුරප්පාඩු සංඛ්‍යාවට බඳවා ගනු ලැබේ.අවසාන පුරප්පාඩු සංඛ්‍යාව සඳහා හෝ අවසන් පුරප්පාඩු කිහිපය සඳහා සම ලකුණු ලබාගත් අයදුම්කරුවන් පුරප්පාඩු සංඛාව ඉක්මවා සිටින අවස්ථාවක දී එම පුරප්පාඩු සංඛ්‍යාව පිරවීම පිළිබඳව තීරණය කාර්ය පටිපාටික රීති 80 වගන්තිය ප්‍රකාරව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලැබේ.

**03. වයස් සීමාව:**

ඉල්ලුම් පත් භාර ගන්නා අවසන් දිනට වයස අවුරුදු 18 නොඅඩු සහ වයස අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

**04. බඳවා ගැනීමේ කොන්දේසි**

ප්‍රථමයෙන් වසරක පුහුණු කාලසීමාවක් සඳහා බඳවා ගෙන,එම පුහුණුව සාර්ථකව නිම කරන නිලධාරීන් 111 වන ශ්‍රේණියට බඳවා ගනු ලැබේ.

**පුහුණු කාල සීමාවට බඳවා ගැනීම සඳහා සුදුසුකම්**

අධ්‍යාපන සුදුසුකම්:

සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව,ගණිතය සහ තවත් විෂයන් දෙකකට සම්මාන සාමාර්ථයන් සහිතව එක් වරකදී විෂයන් හයකින් (06) අ.පො.ස.( සා.පෙළ.) විභාගය සමත් වී තිබීම.

හෝ
ක්ෂේත්‍රයට අදාල NVQ 03 හෝ ඊට ඉහළ සුදුසුකම් ලබා ඇති නිලධාරීන් ඉහත සුදුසුකම් සම්පූර්ණ කර ඇති නිලධාරීන් ලෙස සලකනු ලැබේ.

**වෘත්තීය සුදුසුකම්:**

| තනතුරු නාමය | වෘත්තීය සුදුසුකම් | පුහුණු කාලය |
|---|---|---|
| මු.තා.ශි.(කම්බිකරු)<br>මු.තා.ශි.(සංකේත ලේඛක)<br>මු.තා.ශි.(පිංතාරු)<br>මු.තා.ශි.(බෙලෙක් වැඩ)<br>මු.තා.ශි.(පොරාදු)<br>මු.තා.ශි.(වාත්තු)<br>මු.තා.ශි.(ප්‍රගති)<br>මු.තා.ශි.(කම්මල්) | තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන ආයතනයකින් වසර 2 ½ ක් හෝ ඊට වැඩි පූර්ණ කාලීන කාර්මික පාඨමාලාවක් හදාරා සහතික පත්‍ර ලබා ඇති අයෙකු වීම | අවුරුදු 01 |
| මු.තා.ශි.(වඩු)<br>මු.තා.ශි.(පෙදරේරු) | තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන ආයතනයකින් වඩු හා පෙදරේරු ක්ෂේත්‍රයට අදාල වසරක පුහුණු පාඨමාලාව හදාරා තිබීම හා එම ක්ෂේත්‍රයේ මාස 18 කට නොඅඩු පළපුරුද්දක් ලබා ඇති අයෙකු වීම. | |

**05.** වැටුප් පරිමාණය:

111 ශ්‍රේණිය සඳහා

මෙම තනතුරට රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 10/2025 හි උපලේඛන 1 අනුව අදාල වැටුප් පරිමාණය (MT-01-2025) රු. 50,090-10x540 -11x630 -10x1010 -10x1190- 84,420/- වේ.ඔබට වැටුප් ගෙවනුයේ එම චක්‍රලේඛයේ විධිවිධාන වලට අනුකූලව එහි උපලේඛන හි 111 සඳහන් පරිදි වේ.මෙයට අමතරව රජයේ නිලධාරයන් වෙත රජය විසින් කලින් කලට ගෙවනු ලබන වෙනත් දීමනා ද ඔබට හිමි වේ.

පුහුණු කාල සීමාව සඳහා

මාසික දීමනාව : 2025.04.01-2025.12.31 දින දක්වා මාසික දීමනාව-රු.39,637කි.(ර.ප.ච.10/2025 අනුව සහ ආයතන අධ්‍යක්ෂ ජනරාල්ගේ අනුමැතියට යටත්ව)

**06.** බඳවා ගැනීමේ ක්‍රමය

පුහුණු කාල සීමාවට බඳවා ගැනීමේ ලිඛිත විභාගය සිංහල හා දෙමළ මාධ්‍ය වලින් පමණක් පවත්වනු ලැබේ. ඉල්ලුම් කරන මාධ්‍ය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

අයදුම්කරුවන් විභාගයේ දී පෙනී සිටින සියලුම ප්‍රශ්න පත්‍රවලට එකම භාෂාවකින් පිළිතුරු සැපයිය යුතුය.

විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් දුම්රිය සාමාන්‍යාධිකාරී විසින් පනවනු ලබන නීති රීති වලට විභාග අපේක්ෂකයින් යටත් වේ. එම නීති රීති උල්ලංඝනය කළ හොත් දුම්රිය සාමාන්‍යාධිකාරී විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට සිදු වනු ඇත.

➢ **පුහුණු කාලසීමාවට බඳවා ගැනීමේ ලිඛිත විභාගයේ විෂයන්**

විභාගය ප්‍රශ්න පත්‍ර දෙකකින් සමන්විත වේ.

| අනු අංකය | විෂයන් | කාලය | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|---|---|
| 01 | සාමාන්‍ය දැනීම | පැය 01 | 100 | 40 |
| 02 | බුද්ධි පරීක්ෂණය | පැය 01 | 100 | 40 |

**විෂය නිර්දේශය**

සාමාන්‍ය දැනීම - ශ්‍රී ලංකාවේ සමාජ, දේශපාලන, සංස්කෘතික හා ආර්ථික පරිසරය ද ජාතික හා අන්තර්ජාතික වශයෙන් වැදගත් වන නූතන කරුණු මෙන්ම විද්‍යාත්මක හා කාර්මික සංවර්ධනය සම්බන්ධයෙන් ද අපේක්ෂකයාගේ සාමාන්‍ය දැනීම පිරික්සීම සඳහා වූ ප්‍රශ්න පත්‍රයකි.

බුද්ධි පරීක්ෂණය - අපේක්ෂකයාගේ තර්කානුකූල විශ්ලේෂණ ශක්තියද ක්ෂණිකව තීරණ ගැනීමේ හැකියාවද තක්සේරු කිරීමට හැකි වන අයුරු සංඛ්‍යාමය ගැටළු හා භාෂා බාණ්ඩ,වගු යනාදිය ඇතුළත්ව පින්තූර හා ප්‍රස්ථාර උපයෝගී කර ගනිමින් බහුවරණ ක්‍රමයට සැකසුණු ප්‍රශ්න පත්‍රයකි.

➢ **පුහුණු කාලසීමාවට බඳවා ගැනීමේ යෝග්‍යතා ඇගැයීමේ සම්මුඛ පරීක්ෂණය:**

ලිඛිත තරඟ විභාගයෙන් සමත්වන අයදුම්කරුවන් ලබාගත් ලකුණුවල කුසලතා අනුපිළිවෙළ අනුව පවතින පුරප්පාඩු සංඛ්‍යාවේ දෙගුණයකට සමාන අයදුම්කරුවන් සංඛ්‍යාවක් යෝග්‍යතා ඇගැයීමේ සම්මුඛ පරීක්ෂණයට යොමු කර ලිඛිත විභාගයෙන් හා යෝග්‍යතා ඇගැයීමේ සම්මුඛ පරීක්ෂණයේ දී ලබාගත් ලකුණුවල කුසලතා අනුපිළිවෙළ අනුව අයදුම්පත් කැඳවන අවස්ථාවේ පැවැති පුරප්පාඩු සංඛ්‍යාවට සමාන සංඛ්‍යාවක් බඳවා ගනු ලැබේ.

| ලකුණු ලබා දෙනු ලබන ක්ෂේත්‍ර | උපරිමලකුණු ප්‍රමාණය |
|---|---|
| 01.අතිරේක අධ්‍යාපනික සුදුසුකම්<br>හදාරා ඇති ඉංග්‍රීසි/දෙමළ භාෂා,පරිඝනක සහ වෙනත් පාඨමාලා | 20 |
| 02. අතිරේක වෘත්තීය සුදුසුකම්<br>වෘත්තීයට අදාලව හදාරා ඇති වෙනත් වෘත්තීය පාඨමාලා (මාස 06 සහ මාස 06 වැඩි පාඨමාලා සඳහා ලකුණු ලබා දෙනු ලැබේ.) | 30 |
| 03. තනතුරට අදාළව ලබා ඇති පළපුරුද්ද<br>වසරකට ලකුණු 06 බැගින් උපරිම වසර 05ක් සඳහා සලකා බලනු ලැබේ. | 30 |
| 04. විශේෂ/ බාහිර දක්ෂතා<br>ක්‍රීඩා/සමාජ සේවා යනාදි | 15 |
| 05. සම්මුඛ පරීක්ෂණයේ දී දක්වන ලද ආකල්ප හා පෞරුෂය | 05 |
| එකතුව | 100 |

- **පුහුණු කාලසීමාවෙන් පසුව 111 ශ්‍රේණියට බඳවා ගැනීමේ ක්‍රමය:**

පුහුණු කාලය සඳහා බඳවා ගන්නා ලද පුහුණු ලාභීන් පුහුණුව අවසානයේ දී ලිඛිත හා ප්‍රයෝගික පරීක්ෂණයට යොමු කර සමත් වූ අය 111 ශ්‍රේණියට පත් කරනු ලැබේ. පළමුවර පුහුණුව අවසන් පරීක්ෂණය අසමත් වූ අයට නැවත පැවැත්වෙන පුහුණු අවසන් පරීක්ෂණය සඳහා පෙනී සිටීම සඳහා අවස්ථා 02 ක් ලබා දෙන අතර ඉන් අසමත් වන අයගේ සේවය අවසන් කරනු ලැබේ.

**පුහුණු කාල සීමාවෙන් පසු 111 ශ්‍රේණියට බඳවා ගැනීමේ ලිඛිත විභාගයේ විෂයන් :**

එක් ප්‍රශ්න පත්‍රයකින් පමණක් සමන්විත වේ.

| අනු අංකය | විෂයන් | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|---|
| 01 | තාක්ෂණ විෂය | පැය 02 | 100 | 40 |

**විෂය නිර්දේශය**

තාක්ෂණ විෂය - තනතුරට අදාළව දැනගතයුතු මූලික තාක්ෂණික දැනුම මැන බැලෙන ආකාරයේ ප්‍රශ්න පත්‍රයකින් සමන්විත වේ.

**පුහුණු කාල සීමාවෙන් පසු 111 ශ්‍රේණියට බඳවා ගැනීමේ ප්‍රායෝගික පරීක්ෂණය:**

| අනු අංකය | විෂයන් | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| 01 | තාක්ෂණ විෂය | 100 | 40 |

**විෂය නිර්දේශය**

තාක්ෂණ විෂය - තෝරාගත් විෂය පිළිබඳ නිපුණතාවය මැන බැලීම සඳහා තනතුරට අදාල තාක්ෂණ විෂය සම්බන්ධයෙන් වූ න්‍යායික දැනුම ප්‍රායෝගිකව නිවැරදිව භාවිතයට ගනු ලබන්නේදැයි මැන බැලීම සඳහා ප්‍රායෝගික පරීක්ෂණයක් පවත්වනු ලැබේ.

## 07. සේවා කොන්දේසි:

මෙම තනතුර ස්ථිරය.විශ්‍රාම වැටුප් සහිතය.(විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳව රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයකට යටත් විය යුතුය.)

සෑම අයදුම්කරුවෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට යටත් වනු ඇත.

සෑම අයදුම්කරුවෙකුම විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය.

<u>සේවා ගිවිසුම් පිළිබඳ විස්තර</u>

පුහුණු කාලසීමාවකට බඳවා ගෙන 111 ශ්‍රේණියට පත් කරනු ලබන නිලධාරීන් 111 ශ්‍රේණියට පත් වීම ලද දින සිට වසර 10 ක කාලයක් අනිවාර්යයෙන්ම දුම්රිය දෙපාර්තමේන්තුවේ සේවය කළ යුතුය. එසේ වසර 10ක සේවයට පෙර ඉවත්ව නොයන බවටත් ඊට පෙර සේවයෙන් ඉවත්ව යන්නේ නම් දුම්රිය සාමාන්‍යාධිකාරී විසින් නිර්දේශ කරනු ලබන මුදලක් දෙපාර්තමේන්තුවට ගෙවීමට එකඟ බවටත් රජයේ සේවකයෙකු ඇප කරුවෙකු වශයෙන් ඉදිරිපත් කර වගකීමකට බැඳිය යුතුය.

111 ශ්‍රේණියට බඳවා ගෙන වසර 03 ක් ගතවීමට පෙර පළමුවන කාර්යක්ෂමතා කඩයිම් පරීක්ෂණය සමත්වි යුතුය.

රාජ්‍ය භාෂාව

රාජ්‍ය භාෂාවක් නොවන භාෂා මාධ්‍යයකින් සේවයට බැඳුණු නිලධාරීන් විසින් නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය පරිවාස කාලය තුළ ලබා ගත යුතුය.

අනෙක් රාජ්‍ය භාෂාව: රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 18/2020 සහ ඊට අනුෂාංගික චක්‍රලේඛ විධිවිධාන අනුව අදාල මට්ටමේ ප්‍රවීණතාව ලබා ගත යුතුය.

තෝරා ගනු ලබන්නන් රාජ්‍ය සේවයේ පත්වීම් පාලනය කෙරෙන පොදු කොන්දේසිවලටද, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අංක : PSC/EST/04-01-43/08/2016 හා 2017.09.07 දිනැතිව අනුමත ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ කළමනාකරණ සහකාර තාක්ෂණ ඛණ්ඩ -03 සේවා ගණය සඳහා වන බඳවා ගැනීමේ පරිපාටියෙහි පනවා ඇති නියමයන් හා කොන්දේසි වලටද ,එම පරිපාටියට කර ඇති හෝ මින්මතු කරන සංශෝධන වලටද, ආයතන සංග්‍රහයේ හා මුදල් රෙගුලාසි විධිවිධාන වලටද අංක : 2310/29 හා 2022.12.14 වැනි දරණ අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පරිපාටික රීති වලටද, දෙපාර්තමේන්තු නියෝග හා රෙගුලාසි වලටද යටත් විය යුතුය.

තෝරා ගනු ලබන්නන් නියමිත වෛද්‍ය පරීක්ෂණයෙන් සමත් වීමට අමතරව දුම්රිය දෙපාර්තමේන්තු උපදෙස් මාලාවට අනුව,තනතුරට අදාලව සමත්විය යුතු විශේෂ දක්ෂතා පරීක්ෂණයෙන් ද සමත් විය යුතුය.

**08.** **ව්‍යාජ තොරතුරු සඳහා දඬුවම්:**

ඉල්ලුම් පත්‍රය පිරවීමේ දී ඉතා සැලකිලිමත්ව නිරවද්‍ය තොරතුරු සැපයිය යුතුය.මේ විභාගයේ නීති රීති අනුව යම් අයදුම්කරුවෙකු නුසුදුසු බව අනාවරණය වුවහොත් විභාගයට පෙර හෝ විභාගය පැවැත්වෙද්දී හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවක දී ඔහුගේ/ ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කළ හැකිය.අයදුම්කරුවෙකු විසින් ඉදිරිපත් කරන ලද තොරතුරු ඕනෑම අවස්ථාවක අසත්‍ය බව පෙනී ගිය හොත් හො ඔහු/ ඇය රජයේ සේවයෙන් පහ කිරීමට පුළුවන.අයදුම්කරුවෙකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතුය.

**09.** **විභාග ගාස්තුව:**

විභාග ගාස්තුව රු. 750.00 කි. මෙම මුදල අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට හෝ ඊට පෙර දුම්රිය සාමාන්‍යාධිකාරීගේ මහජන බැංකු නගර මධ්‍ය ශාඛාවේ ගිණුම් අංක 176-100129027-313 ට බැරවෙන පරිදි ඕනෑම මහජන බැංකු ශාඛාවකට ගෙවිය හැකිය. ඒ සඳහා නිකුත් කරන රිසිට් පත අයදුම්පතේ අදාල කොටුවේ නොගැලවෙන සේ ඇලවිය යුතුය.(රිසිට්පතේ ඡායාස්ථ පිටපතක් මතු ප්‍රයෝජනය සඳහා ළඟ තබා ගත යුතුය.)කිසිම හේතුවක් නිසාවත් **විභාග ගාස්තු ආපසු ගෙවනු නොලබන අතර මුදල් ඇණවුම් හා මුද්දර භාර ගනු නොලැබේ.**

**10.** **අයදුම් කළ යුතු ක්‍රමවේදය:**

(අ) අයදුම්පත්‍රය මෙම නිවේදනයට අමුණා ඇති ආදර්ශ ආකෘතියට අනුකූල විය යුතු අතර එය කඩදාසියේ දෙපැත්ත භාවිතා කරමින් ඒ 4(A4) ප්‍රමාණයේ කඩදාසියක ,අයදුම් පත්‍රයේ ශීර්ෂ අංක 1.0 සිට 2.11 තෙක් පළමුවන පිටුවට ද, 3.0 සිට 5.0 තෙක් එහි දෙවන පිටුවට ද,ඉතිරිය තුන්වන පිටුවට ද වන පරිද්දෙන් තම අයදුම්පත්‍රය සකස් කළ යුතු බව විශේෂයෙන් සැලකිය යුතුය.මේ සඳහා පරිගණකයෙන් සකස් කරන ලද/යතුරු ලියනය කරන ලද අයදුම්පත් ද භාවිතා කළ හැකිය.අයදුම්පත්‍රයේ සඳහන් තොරතුරු තම අත් අකුරෙන්ම පැහැදිලිව පිරවිය යුතු අතර ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල නොවන අයදුම්පත්, අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.අයදුම්පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් විය හැක. සම්පූර්ණ කරනු ලබන අයදුම්පත්‍රය මෙම විභාග නිවේදනයේ අවසානයේ දැක්වෙන ආදර්ශ අයදුම් පත්‍රයට අනුකූලද යන්න පිළිබඳව අයදුම්කරු විසින් විමසිලිමත් විය යුතු වේ. එසේ නොවුනහොත් එය ප්‍රතික්ෂේප විය හැකිය.

(ආ) අයදුම්කරුවන් විභාගයට පෙනී සිටීමට අපේක්ෂා කරන භාෂා මාධ්‍යයෙන්ම අයදුම්පත්‍රය සම්පූර්ණ කළ යුතුය.අයදුම්පත්‍රය පිළියෙල කරගන්නා විට එහි ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල අයදුම්පත්‍රවල සිංහල භාෂාවට අමතරව ඉංග්‍රීසියෙන්ද , දෙමළ අයදුම්පත්‍රවල දෙමළ භාෂාවට අමතරව ඉංග්‍රීසියෙන් ද යෙදීම අනවශ්‍ය වේ.

(ඇ) විභාගය සඳහා වන නිවැරදි සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රය පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් ........................ දිනට හෝ ඊට කලින් හෝ ලැබෙනු පිණිස පහත ලිපිනයට එවිය යුතුය.අයදුම්පත් බහා ඇති ලිපි කවරයේ වමත් පස ඉහළ කෙළවරේ පැහැදිලිව " ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ කළමනාකරණ සහකාර තාක්ෂණ බණ්ඩ -03 සේවා ගණයේ මු.තා.ශි.(..............)(ඉල්ලුම් කරන ලද තනතුර වරහන් ඇතුළත නිවැරදිව සඳහන් කරන්න) තනතුරු සඳහා පුහුණු කාල සීමාවට සුදුස්සන් තෝරා ගැනීමේ විවෘත තරඟ විභාගය 2025" යන්න සඳහන් කළ යුතුය.එදිනට පසුව ලැබෙන කිසිදු අයදුම්පතක් භාර ගනු නොලැබේ.

දුම්රිය සාමාන්‍යාධිකාරී,<br>
ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව<br>
පත්වීම් ශාඛාව,නො.355, ඕල්කට් මාවත,<br>
කොළඹ 10

(ඈ) අයදුම්පත්‍රයේ අයදුම්කරුගේ අත්සන රජයේ විද්‍යාලයක විදුහල්පතිවරයෙකු,සාමදාන විනිශ්චයකරුවෙකු, දිවුරුම් කොමසාරිස්වරයකු, නීතිඥවරයකු,ප්‍රසිද්ධ නොතාරිස්වරයකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරී බලයලත් නිලධාරියකු, පොලිස් සේවයේ ගැසට් කළ තනතුරක් දරන නිලධාරියකු හෝ රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියෙකු හෝ බෞද්ධ විහාරස්ථානයක විහාරාධිපති හෝ නායක ස්වාමීන් වහන්සේ නමක් හෝ අන්‍ය ආගමික පූජා ස්ථානයක භාර හෝ පූජ්‍ය පක්ෂයේ සැලකිය යුතු තත්වයක් දරනු අයකු හෝ ලවා සහතික කරනු ලැබ තිබිය යුතුය.

(ඉ) සෑම ආකාරයකින්ම සම්පූර්ණ නොවන අයදුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.තැපැල් කිරීමේ දී අයදුම්පත්‍රයක් නැති වීම හෝ ප්‍රමාද වීම ගැන කිසිදු පැමිණිල්ලක් සලකා බලනු නොලැබේ.

(ඊ) අයදුම්පත් ලද බව දන්වනු නොලැබේ. අයදුම්කරුවන් වෙත ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් නිවේදනයක් දුම්රිය දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවියේ පළ කරනු ලැබේ.නිවේදනය පළ වී දින 02 හෝ 03 ක් ගතවූ පසුවත් ප්‍රවේශ පත්‍රය නොලැබුණි නම් දැන්වීමේ සඳහන් ආකාරයට ඒ බව ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ දුම්රිය සාමාන්‍යාධිකාරී කාර්යාලය වෙත දන්වා සිටිය යුතුය.එසේ දැන්වීමේ දී අයදුම්කළ විභාගයේ නම, අයදුම්කරුගේ සම්පූර්ණ නම, ලිපිනය සහ ජාතික හැඳුනුම්පත් අංකය සඳහන් කළ යුතුය. කොළඹින් බැහැර අයදුම්කරුවකු නම් එම විස්තර සමඟ ෆැක්ස් මඟින් ප්‍රවේශ පත්‍රයේ පිටපතක් එවීම සඳහා අයදුම්කරුගේ ෆැක්ස් අංකය ද සටහන් කොට ඉල්ලීම් ලිපියක් 011-2446490 දරණ ෆැක්ස් අංකයට දුම්රිය දෙපාර්තමේන්තුව වෙත යොමු කරමින් විමසීම වඩාත් ඵලදායී වනු ඇත. තව ද දුම්රිය දෙපාර්තමේන්තුව විසින් ඉල්ලා සිටින අවශ්‍ය තොරතුරක් තහවුරු කිරීම සඳහා අයදුම්කරු විසින් ළඟ තබාගත් අයදුම්පත්‍රයේ පිටපත,විභාග ගාස්තුවට අදාල ලදුපතේ පිටපත හා අයදුම්පත්‍රය තැපැල් කිරීමේ දී ලියාපදිංචි කරන ලද කුවිතාන්සිය සුදානමින් තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

(උ) කිසියම් අයදුම්කරුවෙකු වෙත විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු/ ඇය විභාගයට පෙනී සිටීම සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතුය.

11. **අයදුම්කරුවන්ගේ අනන්‍යතාවය:**

අයදුම්කරුවන්ගේ අනන්‍යතාවය සනාථ කිරීම සඳහා පහත සඳහන් ලියවිලි වලින් එකක් විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය.

- පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මඟින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත
- වලංගු විදේශ ගමන් බලපත්‍රය

12. මෙහි සඳහන් නොවන යම් කරුණක් වේතොත් ඒ සම්බන්ධව දුම්රිය සාමාන්‍යාධිකාරී විසින් තීරණය කරනු ඇත. සියළුම අයදුම්කරුවන් මෙම ගැසට් පත්‍රයේ සඳහන් පොදු විභාග නීති රීති අනුව කටයුතු කිරීමට බැඳී සිටිනු ඇත. තවද සිංහල හා දෙමළ මාධ්‍යන්ගෙන් පළ වන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් නොගැලපීමක් හෝ අනනුකූලතාවයක් ඇති බව පෙනී යන්නේ නම් එවැනි අවස්ථාවක සිංහල මාධ්‍ය නිවේදනයට අනුව කටයුතු කරනු ලැබේ.

ඉංජි.ජේ.අයි.ඩී.ජයසුන්දර
දුම්රිය සාමාන්‍යාධිකාරී

2025 අප්‍රේල් මස 04
ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව,
තැ.පෙ.355,
ඕල්කට් මාවත,
කොළඹ 10.

# ආදර්ශ අයදුම්පත්‍රය

| |
|---|
| |

කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා

**ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ කළමනාකරණ සහකාර තාක්ෂණ බණ්ඩ - 3 සේවා ගණයේ**
**මූලික තාක්ෂණ ශිල්පී III තනතුරට බඳවා ගැනීමේ විවෘත තරඟ විභාගය - 2025**

**Open Competitive Examination for Recruitment to Railway Basic Technician Grade 111 in Sri Lanka Railways.**

1.0 මාධ්‍යය:
විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය: ☐
සිංහල - 2
දෙමළ - 3
(අදාළ අංකය කොටුව තුළ ලියන්න.)අයදුම්පත්‍රය සම්පූර්ණ කළ යුත්තේ විභාගයට ඉදිරිපත් වන භාෂා මාධ්‍යයෙනි.

ඉල්ලුම් කරනු ලබන තනතුර ;- මූ.තා.ශී.(........................)

2.0.පෞද්ගලික තොරතුරු

2.1 සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :- ........................................................................................................

උදා:- (HERATH MUDIYANSELAGE SAMAN KUMARA GUNAWARDHANA)

2.2 අගට යෙදෙන නම මුලින්ද අනෙකුත් නම් වල මුලකුරු පසුවද යොදා නම:

(උදා: GUNAWARDHAN, H.M.S.K) : ........................................................................................................

2.3 සම්පූර්ණ නම: සිංහලෙන්/දෙමළෙන්) : ........................................................................................................

2.4 ස්ථිර ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :(ප්‍රවේශ පත්‍රය මෙම ලිපිනයට තැපැල් කරනු ලැබේ)

: ........................................................................................................

2.5 ස්ත්‍රී/පුරුෂ භාවය : පුරුෂ - 0 අදාළ කොටුව තුළ ලියන්න ☐
ස්ත්‍රී -1

2.6 ජාතික හැඳුනුම්පත් අංකය :- ☐☐☐☐☐☐☐☐☐☐☐☐☐

2.7 විවාහක/ අවිවාහක බව : අවිවාහක - 1 අදාළ කොටුව තුළ ලියන්න ☐
විවාහක - 2

2.8 ජාතිකත්වය (සිංහල -1,දෙමළ- 2, ඉන්දියන් දෙමළ - 3,මුස්ලිම් - 4, වෙනත් -5)
අදාළ කොටුව තුළ ලියන්න ☐

2.9 උපන් දිනය :වර්ෂය ☐☐☐☐ මාසය ☐☐ දිනය ☐☐

2.10 අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස : ☐☐☐☐ වර්ෂය ☐☐ මාසය ☐☐ දිනය

2.11 දුරකථන අංකය : ☐☐☐☐☐☐☐☐☐☐

3.0 සුදුසුකම්

3.1 අධ්‍යාපන සුදුසුකම්- අ.පො.ස.(සා/පෙළ)

වර්ෂය -: ..................... විභාගය-: ..........................

| විෂයය | සමාර්ථය |
| --- | --- |
| 01. ................................ | ........................... |
| 02. ................................ | ........................... |
| 03. ................................ | ........................... |
| 04. ................................ | ........................... |
| 05. ................................ | ........................... |
| 06. ................................ | ........................... |
| 07. ................................ | ........................... |
| 08. ................................ | ........................... |
| 09. ................................ | ........................... |
| 10. ................................ | ........................... |

3.2 තෘතික හා වෘත්තීය කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයකින් හදාරා ඇති

පාඨමාලාවේ නම -:

පාඨමාලාවේ කාලය -: වසර [ ]

....................... දින සිට .................... දින දක්වා

4.0 මුදල් ගෙවූ තැන්පතු පත්‍රිකාවේ පිටපත මනා ලෙස අලවන්න.

| |
| --- |
| මුදල් තැන්පතු පත්‍රිකාවේ (මුල් පිටපත) නොගැලවෙන ලෙස එහි එක් දාරයක මෙහි අලවන්න.(මුදල් තැන්පතු පත්‍රිකාවේ පිටපතෙහි ඡායා පිටපතක් ළඟ තබා ගන්න) |

5.0 අයදුම්කරුගේ සහතිකය

මෙහි සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසය පරිදි සත්‍ය බවත්, විභාග ගාස්තු ගෙවන ලද .............. දිනැති මුදල් තැන්පතු පත්‍රිකාව මීට අලවා ඇති බවත් ප්‍රකාශ කරමි. විභාග නීති රීති වලට එකඟව ක්‍රියා කිරීමටත් මෙම විභාගය පිළිබඳ වධිවිධාන ඇතුළත් සේවා ව්‍යවස්ථාව අනුව මා නුසුදුස්සකු බව පෙනී ගිය හොත්, විභාගයට පෙර හෝ එය පවත්වද්දී හෝ ඉන් පසුව මාගේ විභාග අපේක්ෂකත්වය අවලංගු කිරීම ගැන මම එකඟ වෙමි.තව ද විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් දුම්රිය සාමාන්‍යාධිකාරී විසින් පනවනු ලබන නීති රීති වලට මම යටත් වන බව ප්‍රකාශ කරමි.

දිනය : ............................ ...........................

අයදුම්කරුගේ අත්සන

දුම්කරුගේ අත්සන සහතික කිරීම (ගැසට් නිවේදනයේ 10 ඇ පරිදි විය යුතුය.)

මෙම අයදුම්පත්‍රය ඉදිරිපත් කරන...................(සම්පූර්ණ නම) යන අය මා පෞද්ගලික හඳුනන බවත්,නියමිත භාග ගාස්තුව ගෙවා ඇති බවත්,එම ලදුපත අලවා ඇති බවත්.............. දින ඔහුගේ/ඇයගේ අත්සන මා ඉදිරියේ දී තැබූ බවත් මම සහතික කරමි.

දිනය : .............................

.....................................................

සහතික කරන නිලධාරියාගේ අත්සන

අත්සන සහතික කරන නිලධාරියාගේ සම්පූර්ණ නම : .......................................................................................

තනතුර : ..............................................

ලිපිනය : ..............................................

(නිල මුද්‍රාව)

7.0 ආයතන ප්‍රධානියාගේ සහතිකය : (රාජ්‍ය/ පළාත්රාජ්‍ය/රාජ්‍ය සංස්ථා සේවයේ නියතු අයදුම්කරුවන් සඳහා පමණි.)

මෙම අයදුම්පත්‍රය ඉදිරිපත් කරන ........... මයා/මිය/ මෙනවිය මෙම අමාත්‍යාංශයේ/ දෙපාර්තමේන්තුවේ/ආයතනයේ ......................... ලෙස සේවය කරන අතර ඔහුගේ/ඇයගේ අයදුම්පත්‍රය නිර්දේශ කර ඉදිරිපත් කරමි.මෙම තනතුර සඳහා තෝරාගනු ලැබුවහොත් මෙම ආයතයේ සේවයෙන් නිදහස් කිරීමට අවශ්‍ය කටයුතු සිදු කළ හැකිය.

.................................................

ආයතන ප්‍රධානියාගේ අත්සන

නම : ....................................

පදවි නාමය : ................................

දිනය : ........................................

(නිල මුද්‍රාව)